# Sri Sumangala College - Panadura

## OLD BOYS' MEDICAL ASSOCIATION

Panadura 12500, Sri Lanka.
Tel: 038-5671147 E-mail: sscobapp@sltnet.lk

Established 2011


**2012/06/01**

**ගරු ලේකම් තුමා,**

**ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය ,**

අප ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි ශිෂ්‍ය මවු සංගමයට අනුබද්ධව එහි අනුග්‍රහය යටතේ "ශ්‍රී සුමංගල විද්‍යාලයීය ආදි වෛද්‍ය වෘත්තිකයින්ගේ සංගමය " වර්ෂ 2011 පෙබරවාරි 27 වන දින පිහිටුවාගනු ලැබින. මෙම සංගමය ගොඩනැගීමේ මූලික පරමාර්ථ පහක් පහත සඳහන් පරිදි විය.

(1) වර්තමාන හා ආදි ගුරුභවතුන්ගේ සෞඛ්‍ය සුභසාධනය නගා සිටුවීම .

(2) ආදි ශිෂ්‍ය මවු සංගමය මගින් සංවිධානය කරන සෞඛ්‍ය කඳවුරට හා අනෙකුත් කටයුතු වලට දායක වීම .

(3) පාසැල තුල "සෞඛ්‍ය ඒකකයක් " පිහිටුවා ඒ මගින් වර්තමාන ශිෂ්‍ය ප්‍රජාවගේ සෞඛ්‍ය සුභසාධනය සඳහා දායක වීම.

(4) වර්තමාන සිසුනට සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් සහ අවබෝධයක් ලබාගත හැකි ලෙස කටයුතු ක්‍රියාත්මක කිරීම.

ඒ අනුව මෙහි මූලික පරමාර්ථ අප විසින් සම්මත කරගත් සංගමයේ ව්‍යවස්ථාවට ඇතුලත් වි ඇති අතර , එකී පරමාර්ථ ඉටුකිරීමේ අරමුණින් යුක්තව ගෙවී ගිය වසරක කාලයක් තුල සිට පහත සඳහන් ලෙස අපි ක්‍රියාකාරීව කටයුතු කරමින් සිටිමු .

(1) වර්තමාන සිසුනගේ හා ගුරුභවතුන්ගේ සෞඛ්‍ය සුභසාධනය නගාසිටුවීමේ සංගමයේ. පරමාර්ථ වලට අනුකූලව උපදේශන සේවාවන් පවත්වාගෙන යාමේ අරමුණින් යුක්තව පාසැල තුල " සෞඛ්‍ය සුමිතුරෝ " නම් වූ ඒකකය 2011 දෙසැම්බර් 02 වන දින ආරම්භකරන ලදී. ඒ අනුව සැම සති දෙකකට වරක් එලැඹෙන සිකුරාදා දින අප සංගමයට අනුබද්ධ වෛද්‍යවරයකු විසින් , පංතිභාර ගුරුභවතුන්ගේ අනුමැතියෙන් එම ඒකකය වෙත යොමුකරනු ලබන සිසුන් මෙන්ම ගුරුභවතුන්ද පරීක්ෂාකර අවශ්‍ය ප්‍රතිකාර හා උපදේශන සේවාවන් හා අවශ්‍ය ඖෂධ ද සැපයීමද සිදුකරනු ලබන අතර මෙය මෙතෙක් අඛන්ඩව සිදුවෙමින් පවතී.

(2) මෙතෙක් කණිෂ්ඨ ආදි ශිෂ්‍ය සංගමය මගින් පවත්වාගෙන යනු ලැබූ වෛද්‍ය සායනය ඔවුනගේ සහභාගිත්වය හා දායකත්වය යටතේ අප සංගමය මගින් 2011 ඔක්තොබර් 30 වන දින විද්‍යාලයීය පරිශ්‍රයේදී පවත්වනු ලැබූ අතර , එදින රෝගීන් පරීක්ෂා කර අවශ්‍ය ඖෂධ ලබාදීම අප සංගමයේ වෛද්‍යවරුන් හා සෙසු වෛද්‍ය වෘත්තිකයින් විසින් සිදුකරනු ලැබූ අතර ,අවශ්‍ය ඖෂධ එකී වෛද්‍යවරුන්ගෙන් සහ ඖෂධ සමාගම් මගින් සපයා ගනු ලැබින.

(3) පාසැලෙන් වෛද්‍ය විද්‍යාලයට තේරී පත්වන වෛද්‍ය සිසුනට ආර්ථිකමය පහසුවක් සැලසීම සඳහා යම් පමණකින් දායකවීමේ අරමුණින් යුක්තව , ඔවුනට "මුදල්මය පරිත්‍යාග" ලබාදීමට සියළු කටයුතු සුදානම්කර තිබෙන අතර , වඩාත් ආර්ථික අපහසුකම ඇති සිසුවාගේ මතු ප්‍රයෝජනය වෙනුවෙන් , ඉදිරි අධ්‍යාපනයේදී අත්‍යවශය වන හා පරිශීලනය කලයුතු පොත් කට්ටලයක් අපගේ ආදි වෛද්‍ය විශේෂඥවරුන්ගේ ප්‍රදානයන් අනුව ලබාදීමද නුදුරේදී සිදුවනු ඇත.

(4) අපගේ ආදි ගුරුභවතුන්ගේ සෞඛ්‍ය සුභසාධනය නගා සිටුවීමේ මූලික වූ අරමුණින් යුක්තව අප සංගමයේ අනුග්‍රහය යටතේ එම ගුරුභවතුන් පරීක්ෂාකර අවශ්‍ය උපදේශන සේවාවන් හා ප්‍රතිකාර ලබාදීමේ ස්වේච්චා සේවාවක් විශේෂඥ වෛද්‍ය කෝසල ද සිල්වා මහතා විසින් තුන් මසකට වරක් ඉටුකරනු ලබයි.

එමෙන්ම එම ගුරුභවතුනට සිය ඖෂධ මිලදී ගැනීමේ දී කිසියම් ආර්ථිකමය පහසුවක් සලසාදීමේ අරුමුණින් යුක්තව ඔවුන් වෙත සංගමයේ අනුග්‍රහය යටතේ නිකුත්කර දී ඇති "විශේෂ වූ හැඳුනුම්පතක් " මත පානදුර ඩෝන් ෆාමසි ආයතනයෙන් 6% ක වට්ටම් අඩුකිරීමක් මත ඖෂධ ලබාගැනීමට පහසුකම සලසා දී ඇති අතර , මෙම සේවාව මගින් එකී ගුරුභවතුන් පනස් පස් දෙනෙකු පමණ ඉන් ප්‍රතිලාභ ලබමින් සිටී.

(5) වර්තමාන සිසුනට සෞඛ්‍ය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් දැනුමක් හා අවබෝධයක් ලබා දියයුතුවීමේ පරමාර්ථය ක්‍රියාවට නැගීමේ අරමුණින් යුක්තව, අදාල ගුරුභවතුන් හා සාකච්චාකර ඔවුන් වෙනුවෙන් සුදුසු මාතෘකා යටතේ දේශණ පවත්වාගෙන යාමේ පුළුල් වැඩ පිළිවෙල පිළිබඳව මේවන විටත් පාසැල් බලධාරීන් දැනුවත් කර තිබේන අතර නුදුරේදී එම වැඩ පිළිවෙලද අප සංගමය මගින් ක්‍රියාවට නැගෙනු ඇත.

කෙසේ නමුත් වෘත්තිමය වශයෙන් ඉතාමත් කාර්යබහුල සේවාවන් වල යෙදී සිටින අප ආදි වෛද්‍ය වෘත්තිකයින් , අවිවේකිව දැඩි උත්සහයකින් යුක්තව ගෙවී ගිය වසරක කාලයක් තුල අපගේ අරමුණු වෙත ලඟාවීම සඳහා ලබාදුන් දායකත්වය පිළිබඳව සංගමය සෑහීමකට පත්වන අතර , අප ආදි ශිෂ්‍ය මවු සංගමයේ අනුග්‍රහය යටතේ ඊට අනුබද්ධව ගොඩනැගූ අප සංගමය ගෙවී ගිය වසරක කාලය තුල ක්‍රියාත්මක කල ක්‍රියාකාරකම් පිළිබඳ මවු සංගමය දැනුවත් කල යුතු වීමේ වගකීමක් ලෙස , මෙම කෙටි සමාලෝචනය වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරමු.

**ස්තූතියි !**

| | |
|---|---|
| ............................ | ............................ |
| සම ලේකම් | ගරු සභාපති |
| (අතුල ජයදේව සිල්වා) | (විශේෂඥ වෛද්‍ය කෝසල ද සිල්වා) |